# ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අ.පො.ස ( සා .පෙළ ) – 2020

# 85 - ගෘහ ආර්ථික විද්‍යාව - I හා II පත්‍රය

## රෙදිපිළි තාක්ෂණ ක්ෂේත්‍රය

ඔබ මෙවර අ.පො.ස ( සා. පෙළ) විභාගයට ඉදිරිපත්වන දරුවෙකි. ගෘහ ආර්ථික විද්‍යාව විෂයට අදාළ **රෙදි පිළි තාක්ෂණ** ක්ෂේත්‍රයේ බහුවර්ණ හා ව්‍යුහගත ප්‍රශ්න ප්‍රමාණයට ගැන සැළකිලිමත් වී , විශේෂයෙන් ම II වන පත්‍රය වන ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයේ 2 වන ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා , එයට හිමි උපරිම ලකුණු ලබා ගැනීමට කටයුතු කරන්න. ( ගණිත ගැටළුවකට නිශ්චිත ලකුණු ලැබෙනවා සේ , ඔබට ද මෙම ක්ෂේත්‍රය සඳහා ලකුණු ලැබෙනවා ඇත. )

**ප්‍රශ්න පත්‍ර රටාව**

I පත්‍රය වන බහුවරණ ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 28- 36 දක්වා ප්‍රශ්න 08 ක් මෙම ක්ෂේත්‍රයට අයත්ය.

11 පත්‍රය වන ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයේ 1 වැනි ප්‍රශ්නයේ කොටස් 10 න් (V) හා (VI) යන ප්‍රශන 02 කට කෙටි පිළිතුරු සැපයීම ද , 2 වන ප්‍රශ්නයම මෙම ක්ෂේත්‍රයට අයත් වේ.

ඔබ 10 හා 11 ශ්‍රේණිවල පෙළපොත් නිසි ලෙස අධ්‍යයනය කර, ඔබට ලැබෙන ප්‍රශ්න පත්‍රයේ රෙදි පිළි ක්ෂේත්‍රයට මුහුණ දීම තුළ ලකුණු 100 න් ලකුණු 22 ක්ම ලබා ගත හැකිවේ. අපහසුතාවයකින් තොරව මෙම ක්ෂේත්‍රයෙන් උපරිම ලෙස ලබා ගත හැකි ලකුණු ප්‍රමාණය 22 කි.

| | | |
|---|---|---|
| 1 පත්‍රය - | බහුවර්ණ ප්‍රශන 08 × ලකුණු 01 | = ලකුණු 08 |
| 11 පත්‍රය - | 1 ප්‍රශනයෙහි V, VI යන කෙටි ප්‍රශ්න 02× ලකුණු 2 | = ලකුණු 04 |
| | 2 ප්‍රශ්නයට හිමි ලකුණු | = ලකුණු 10 |
| | මුළු එකතුව | = ලකුණු 22 |

10 හා 11 ශ්‍රේණි පෙළ පොතෙහි රෙදි පිළි තාක්ෂණයට අදාළ 10 හා 11 නිපුණතා හා නිපුණතා මට්ටම් වලට අදාළව , ඔබ ප්‍රායොගිකව හදාරණ ලද මැහුම් වැඩ මතකයට නගා ගැනීම තුළින් පිළිතුරු සොයා ගැනිමට පහසුවක් වේ.

ඔබට අනුමාන ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරන අතර එහි රටාව හා අන්තර්ගතය හඳුනාගන්න.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## I පත්‍රය

### බහුවරණ ප්‍රශ්න

1. ළමා ගවුමෙහි රවුම් හැඩැති කර, නිම කිරීමට යොදා ගත **නොහැකි** ක්‍රමය වන්නේ ,
   1) විකර්ණාකාර පටියක් අල්ලා අඩක් පෙනෙන සේ නවා මැසීමය.
   2) කෙලින් පටියක් අල්ලා යටට නවා මැසීමය.
   3) හැඩ පෝරුවක් අල්ලා සම්පූර්ණයෙන්ම නවා මැසීමය.
   4) විකර්ණකර පටියක් අල්ලා සම්පූර්ණයෙන්ම නවා මැසීමය.

2. සත්වමය කෙඳි වර්ගයකි.
   1) ලෝම 2) නියඳ 3) ලිනන් 4) රැම්

3. රෙදි පිළි තාක්ෂණය හා සම්බන්ධ පහත සඳහන් වැකි අතුරෙන් **නිරවද්‍ය** වැකිය තෝරන්න.
   1) ළඳරු ඇඳුමේ මූට්ටු නිම කිරීමට විවෘත පැතලි මූට්ටුව යොදාගත හැකිය.
   2) සෙවනැලි මැස්ම සඳහා සැටින් මැස්ම යොදා ගත හැකිය.
   3) සේද කෙඳි ලබා ගන්නේ මැරිනෝ බැටළුවාගෙනි.
   4) කේස්මන්ට් හා රෙප් රෙදි , කුෂන් කවර සඳහා සුදුසු වේ.

4. ශිල්පීය මැහුම් ක්‍රමවලට අයත් වන්නේ,
   1) හීන්නූල් දුවවීම හා වාට් මැස්ම ය.
   2) බඳන යෙදීම හා සැනගාංචු ඇල්ලීම ය.
   3) පයිපින් කිරීම හා පිස්මේන්තු මැසිමය.
   4) සැනගාංචු ඇල්ලීම හා හීන්නූල් දුවවීම ය.

5. බන්දේසි කවරයෙහි වටේ දාරය අලංකාර කිරීමට යෙදිය හැකි අක් සැරසිලි ක්‍රමය වන්නේ,
   1) සීක්වින්ස් සහ බොත්තම් ඇල්ලීම ය.
   2) රේන්ද සහ රැළි පටි ඇල්ලීම ය.
   3) රිබන් සහ බොත්තම් ඇල්ලීම ය.
   4) පබළු සහ රේන්ද ඇල්ලීම ය.

## II පත්‍රය

1. වන ප්‍රශ්නයේ දෙනු ලබන සිද්ධියට අදාළව (V) හා ( vi) ප්‍රශ්නවල දී අසනු ලබන කෙටි ප්‍රශ්න . ( කෙටි පිළිතුරු අපෙක්ෂිතයි.)
   I. ළඳරු ඇඳුම් සඳහා සුදුසු රෙදි වර්ග **දෙකක්** නම් කරන්න.
   II. ළඳරු ඇඳුම් සඳහා කපු රෙදි යෝග්‍යවීමට හේතු දෙකක් ලියන්න.
   III. කුෂන් කවර මැසීම සඳහා යෝග්‍යවන අයිඩා හා ජාවා රෙදිවල , වඩාත් අලංකාරව හැකි විසිතුරු මැහුම් ක්‍රමය නම් කරන්න.
   IV. නිවසේ දී ගෘහණිය විසින් උපාංග නිර්මාණයට යොමුවීම තුළින් , සැළසෙන වාසි **දෙකක්** සඳහන් කරන්න.
   V. දරුවාගේ වීදුරු වතුර බෝතලයෙහි ආරක්ෂාව සඳහා , එම මසන ලද බෝතල් ආවරණ යෙහි තිබිය යුතු විශේෂ ලක්ෂණයක් ලියන්න.
   **(සමහර අවස්ථාවල ඡේදයට සම්බන්ධ නොවන ආසන්න ප්‍රශ්න ඇසිය හැකිය. )**


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**ව්‍යුහගත 2 වන ප්‍රශ්නය**

1)

I. ළදරු ඇඳුමෙහි උරහිස සඳහා යොදන **මූට්ටුව** හා **විවර පියවීමට** සුදුසු ක්‍රමය නම් කරන්න.
( ලකුණු 1 ½ + 11/2 )
( ලකුණු 03 )

II. ළදරු ඇඳුමක තිබිය යුතු විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.
( ලකුණු 03)

III. ළදරු ඇඳුමේ ඉදිරිපස අලංකාර කිරීම සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ , එය මැසීමට යොදා ගන්නා මැහුම් ක්‍රම **හතරක්** නම් කරන්න.
( ලකුණු 02 + 02 )
( ලකුණු 04 )

2)

I. ළමා ගවුමේ වාටිය නිම කිරීමට භාවිත කළ හැකි ක්‍රම **තුනක්** නම් කරන්න.
( ලකුණු 03 )

II. රෙදි පිරියම් කිරීමේ ක්‍රම **දෙකක්** නම් කර , ඉන් එකක් විස්තර කරන්න.
( ලකුණු 01 +01+ 01)
( ලකුණු 03 )

III. ළමා ගවුමේ කඳ කොටස සඳහා පතරොම නිර්මාණය කිරීමේ දී අවශ්‍ය මිනුම් 8ක් සඳහන් කරන්න.

(අදාළ එක් , එක් මිනුමට ලකුණු ½ බැගින් ලකුණු 04)
(මුළු ලකුණු 10)

*******


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**රෙදි පිළි තාක්ෂණය - පිළිතුරු**

1. 2
2. 1
3. 4
4. 2
5. 2

**11 පත්‍රය**

**01.**

I. • මල් රෙදි • නෙත්සුක් • ලෝන් • වොයිල්

II. • සිනිඳු හා මෘදු බවින් යුතු වීම • නිතර සේදීමට හැකිවීම
•සේදීමේදී හා මැදීමේදී ඉහළ උෂ්ණත්වයකට භාජනය කළ හැකි වීම.
•මනා තෙතමනය අවශෝෂකතාවයකින් යුතු වීම.

III. කතිර මැස්ම

IV. • නිවසේ ක්‍රමවත් බව හා අලංකාරය වැඩි කිරීමට •ස්වයං රැකියාවට යොමු වීම (අලෙවි කිරීම තුළින් ) •විවේක කාලය ඵලදායි ලෙස ගත කිරීමට •මානසික තෘප්තියක් ලැබීමට
•අපතේ යන දෙයින් ප්‍රයෝජනයක් ලැබීමට

V. පැඩිං යොදා ක්විල්ට් කිරීම

**ව්‍යුහගත ප්‍රශ්න - 2 වන ප්‍රශ්නය**

**1.**

i. • උරහිසට යොදන මූට්ටුව -පැතලි මූට්ටුව
• පියවීමට - ටේප් ඇල්ලීම

II. •ඇඳුම් ලිහිල් වීම. •සරල පන්නයකින් යුතු වීම.
• ඇඟලෑමට හා පියවීමට පහසු වීම. •මූට්ටු අවම වීම.
•මූට්ටු සඳහා පැතලි මූට්ටුව යෙදීම. •විවර පියවීමට ටේප් ඇල්ලීම.
•අලංකාර කිරීමට සරල මෝස්තර හා විසිතුරු මැහුම් ක්‍රම යොදා ගැනීම.

IV. (මෙහිදී ළඳරු ඇඳුමකට සුදුසු මෝස්තරයක් ඇඳීම මෙන්ම එය කුඩා ගැලපෙන ප්‍රමාණයට ඇඳීම ඉතා වැදගත්.ප්‍රශ්නයට අදාළව මෝස්තරය ඇඳීමෙන් පසු මැහුම් ක්‍රම එහිම සටහන් කළ හැකිය.)

රූප සටහන


Copyright © www.e-thaksalawa.moe.gov.lk

2. I • වාටිය නවා , වාටි මැස්මෙන් මැසීම.

•වාටිය මසා , නැමුම් දාරයට අඟල් ½ හෝ අඟලක රේන්දයක් ඇල්ලීම.

• රැළි කරන ලද රැළි පටියක් ඇල්ලීම.

II **<u>• කැඳ ඉවත් කිරීම</u>**

රෙද්ද පැය කිහිපයක් ජලයේ පොඟවා , කැඳ සෝදා හැර , රෙද්දේ වතුර ගසා , වැලක එල්ලා වේලා , ස්ත්‍රික්ක කරන්න.

**<u>• රෙද්දේ ඇද ඇරීම</u>**

රෙද්ද විකර්ණය ඔස්සේ දෙකෙළවරින් අදිමින් ඇදය ඉවත් කර , ඉස්ත්‍රික්ක කිරීම . පසුව හරස් නූලක් ඉවත්කර ඒ ඔස්සේ කැපීම.

• රැළි ඉවත් කිරීමට ස්ත්‍රික්ක කිරීම.

III • පපුව වටා මිනුම • ඉණ වටා මිණුම •උරහිස සිට ඉන දක්වා උස

• පළමු හරස් මිම්ම • දෙවන හරස් මිම්ම •උරහිස පළල •කර පළල හා ගැඹුර • ආර උස හා ආර අතර පළල

*********



Copyright © www.e-thaksalawa.moe.gov.lk